# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/65 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/01/2019/170.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.02.05 දිනැති හා අංක 2213/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.12 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඉංගිරිය, පාදුක්ක පාර, අංක 28/B/15 හි පිහිටි ලංකා කම්කරු කොංග්‍රසය (පී. සීතාදේවී මිය වෙනුවෙන්) සහ කොළඹ 12, මිරානියා වීදිය, බී. සී. සී. පරිශ්‍රය, 21 හි පිහිටි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2021.12.10 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 දෙසැම්බර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/01/2019/170.

කාර්මික අධිකරණයේ දී ය,

1. පී. සීතාදේවී වෙනුවෙන්
ලංකා කම්කරු කොංග්‍රසය
අංක 28 B/15, පාදුක්ක පාර,
ඉංගිරිය.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A/07/2021

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
21, බී. සී. සී. පරිශ්‍රය,
මිරානියා වීදිය,
කොළඹ 12.

අතර පවත්නා කාර්මික ආරාවුල

*දෙවන පාර්ශ්වය*

වර්ෂ 2021 ක් වූ ජූලි මස 28 වැනි දින,

ලිඛිත දේශන අගවුම් (වී 1) සිට (වී 4) දක්වා වූ ලේඛන ද හේෂලා ඉලේපෙරුම නීති නිලධාරී දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.

වර්ෂ 2021 ක් වූ ජූලි මස 26 වැනි දින

ලිඛිත දේශන අගවුම් (ඒ 1) සිට (ඒ 4) දක්වා වූ ලේඛන ද එම් ත්‍යාගරාජ, පී. සීතාදේවී වෙනුවෙන් පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කර ඇත.

#### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා අංක 62 සහ 1962 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන පනත්වලින් සංශෝධනය වූ ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාර වූ උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2021/01/20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.


1 A – G 35768 — 17 (2022/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ආරවුලට හේතු වී ඇති කරුණු**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝග ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්ව අතර උද්ගතව ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි විසින් 2021/01/20 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ ය.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පාර්ක් වතුයායේ සේවයේ සිටි පී. සීතාදේවී නැමැති සේවිකාවට ලබා දීමට නිර්දේශ කර ඇති රුපියල් 260,000/- වන්දි මුදල් නොදීම යුක්ති සහගත ද යන්නත් එය යුක්ති සහගත නොවන්නේ නම් එය ඇයට ලබා දීමය.

**පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම පරීක්ෂණය 2021/02/01 මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුළ 2021/02/10, 2021/04/21, පවත්වන ලදී. 2021/06/03 දන්වා තිබුණත් රටේ පවතින තත්වය අනුව එම දිනය 2021/07/20 දින පවත්වා ලිඛිත දේශන 2021/07/31 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. සෑම දිනකම පරීක්ෂණය සඳහා පළමුවැනි පාර්ශවයේ පී. සීතාදේවී හට ඇය වෙනුවෙන් පෙනී සිටින ත්‍යාගරාජා මහතා යන අය පෙනී සිටින ලදී.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් මුල් දිනයේ දී නීති නිලධාරි හේෂලා ඉලේපෙරුම මැතිණිය සහ ජී. බී. සී. ෆොන්සේකා සහකාර කළමනාකරණ මහතා පෙනී සිටින ලදී.

**ප්‍රදානය කිරීමේ ස්ථාවරය**

ඉහත සඳහන් කරන ලද කරුණු අනුව මෙම ප්‍රදානය කරනු ලැබේ.

**ප්‍රදානය**

1. පලවන පාරශ්වය ඉල්ලුම් කරන ලද වන්දි මුදල වන රු. 260,000/- ගෙවන ලෙසට දන්වා සිටිමි.

2. රුපියල් 260,000/- ක සඳහන් මුදලට අමතරව වෙන කිසිදු මුදලක් කිසිම පාර්ශ්වයකට හිමි නොවේ. තව ද, බේරුම් කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවේ.

3. එම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල 2022.01.21 වන දිනට ප්‍රථම උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ කොමසාරිස් නමින් තැන්පත් කරන ලෙස මෙයින් නියෝග කරමි. මෙය සාධාරණ හා යුක්ති සහගත බව සහතික කරමි.

මෙම ප්‍රදානය ගැසට් පත්‍රයේ පළ වීමෙන් වලංගු වේ.

2021.12.10 වැනි දින කාර්මික අධිකරණයේ දීය.

කපිතන් එම්. ජී. ජී. මෙන්ඩිස්,
බේරුම්කරු,

**පසුබිම**

මෙම බේරුම්කරණයට යොමු කිරීමට අදාළව උද්ගත වී ඇති කාර්මික ආරවුල පිළිබඳ පසුබිම වන්නේ ලැබීමට තිබෙන මුදල ලබා නොදීමයි. ඒ අනුව ඇය ඉල්ලා සිටින්නේ ඇයට හිමි වන්දි මුදල වන රුපියල් 260,000/- ක මුදල ලබාදෙන ලෙස ය.

1. දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනාවල පලවෙනි පිටුවේ තුන්වන ඡේදයේ සඳහන් භාරදිමි. භාරගතිමි. සම්බන්ධයෙන් කිසිම ප්‍රකාශයක් පරීක්ෂණයේ දී සඳහන් කර නැත.

2. දෙවැනි පිටුවේ අවසාන ඡේදයේ අමතර පර්චස් 10 සම්බන්ධයෙන් පී. සීතාදේවී සහ ඒ. සීතාදේවී යනුවෙන් පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකෙරුණි. එසේ ඉදිරිපත් කිරීමක් කලේ නම් මෙය එවලේ නිරාකරණය කිරීමට හැකියාව තිබිණ.

3. අංක SLSPC/LEG/CWC/Perth 12/03/2021 වී 4 ලිපියට පිළිතුරක් ලබා ගැනීමට කිසිම සිහි කැඳවීමක් කර නොමැත.

4. කිසිම විටක දෙවන පාර්ශවය ලිඛිත දේශනවලින් ඉදිරිපත් කෙරුණු කරුණු පරීක්ෂණයේ දී ඉදිරිපත් නොකරන ලදී.

   (a) පළවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද කම්කරු දෙපාර්තමේන්තුවේ A 2 අංක බස්.ක.2./පැමිණිලි/2016/20 නියෝගයද ක්‍රියාත්මක කර නොමැත.

   (b) පළවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද A 4 ලිපිය අනුව පුද්ගලයින් දස දෙනෙකුට සත්ව ගොවිපලවල් පවත්වාගෙන යන අයට පොදු ස්ථානයක එය පවත්වාගෙන යාමට අවශ්‍ය භූමි ප්‍රමාණ වෙන් කර ඇති බවයි.

EOG 1 - 0070

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.